# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1994/73 - 2016 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පානදුර නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද පානදුර නගර සභා ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2016 ඔක්තෝබර් මස 07 වැනි දින අනුමත කරන ලද බවත්, මෙම ගැසට් නිවේදනය පළ වූ දින සිට එය බලපැවැත්වෙන බවත්, මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2016 නොවැම්බර් මස 23 වැනි දින.

### පානදුර නගර සභා බල ප්‍රදේශයෙන් සමන්විත වන පානදුර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8ඊ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2008.11.13 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන පානදුර නගර සභා බල ප්‍රදේශයෙන් සංයුක්ත වන පානදුර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 07 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 සහ 18 වන මහල්,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

12-480

1A - G 24647 — 55 (2016/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*